සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

තෙවන වාර පරීක්ෂණය 2022 — 11 ශ්‍රේණිය
மூன்றாம் தவணைப் பரீட்சை 2022 — தரம் 11
Third Term Test 2022 — Grade 11

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I
தகவல் மற்றும் தொடர்பாடல் தொழில்நுட்பம் I
Information and Communication Technology - I

පැය 1 යි
1 மணித்தியாலயம்
1 hour

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(1). පරිගණකයද පද්ධතියකි. එහි කාර්යය භාරය පහත පරිදි වේ. හිස්තැනට අදාළ වචනය අඩංගු පිළිතුර තෝරන්න.
එහි ප්‍රධාන කාර්යය වන්නේ ............A.......... ලබා ගැනීමත් ඒවා ..............B............. හා .......C..... , අවශ්‍ය වූ විට .........D............ , ලබා දීමත් වේ.

| | | | | |
|---|---|---|---|---|
| 1. | A - සැකසීම | B- ආදාන | C- ප්‍රතිදාන | D- තොරතුරු |
| 2. | A- ආදාන | B -ප්‍රතිදාන | C -තොරතුරු | D- සැකසීම |
| 3. | A- දත්ත | B- සැකසීම | C- සුරැකීම | D- තොරතුරු |
| 4. | A- තොරතුරු | B- දත්ත | C- සුරැකීම | D- පද්ධති |

(2). QR කේතය ආදානය කිරීමේදී එහි ආදාන උපාංගය වන්නේ,
1. සුහුරු ජංගම දුරකථනය
2. සුහුරු ජංගම දුරකථනයේ කැමරාව
3. සුහුරු ජංගම දුරකථනයේ තිරය
4. යතුරු පැනලය

(3). තොරතුරක වටිනාකම රැකගැනීමට අදාළ නොවන ලක්ෂණය වන්නේ,
1. අදාළ බව 2. කාලීන බව 3. අංගසම්පූර්ණ බව 4. අධික වටිනාකම


(4). නිවාසවල ජල බිල්පත් කියවීමේදී ලබා දෙන විස්තරය යන ක්‍රියාව අයත් රාජ්‍ය සේවාව හා බිල්පත සැකසීමේ ක්‍රමය වන්නේ,

1 .G2C, කාණ්ඩ සැකසීම
2. G2E, කාණ්ඩ සැකසීම
3. G2C, මාර්ගගත සැකසීම
4. G2E, තත්‍යකාල සැකසීම

(5). e - බැංකු සේවය ලබා ගැනීමේ වාසියක් නොවන්නේ,
1. තතුබැමකට ලක්විය හැකිවීම
2. පහසු ස්ථානයක සිට ගිණුම් පරීක්ෂා කිරීමේ හැකියාව
3. දුරකථනයෙන් බිල්පත් ගෙවීමේ හැකියාව
4. බැංකු අතර මුදල් හුවමාරු කිරීමේ හැකියාව


(6). Windows මෙහෙයුම් පද්ධතිය තුල ඇත්තේ චිත්‍රක පරිශීලක අතුරු මුහුණතක්ය.චිත්‍රක පරිශීලක අතුරු මුහුණත භාවිතයට පැමිණි පරිගණක පරම්පරාව වන්නේ,
1. පළමු 2. දෙවන 3. තෙවන 4. සිව්වන

(7). රූපවාහිනී යන්ත්‍රයක් සවිකිරීමේ හැකියාව ඇති ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් ප්‍රතිදාන ලබාගත හැකි කෙවෙනියක් වන්නේ,



1 2 3 4

(8). මෙම රූපසටහනේ දැක්වෙන්නේ මොඩම් උපකරණයේ ක්‍රියාවයි.




එහි මූර්ජනය (modulation) හා වීමූර්ජනය (demodulation) ලෙස පිළිවෙලින් හඳුන්වන්නේ,

1. ප්‍රතිසම තරංග අංකිත සංඥා බවට හැරවීම
2. අංකිත සංඥා ප්‍රතිසම තරංග බවට හැරවීම
3. අංකිත සංඥා ප්‍රතිසම තරංග කිරීමත් ප්‍රතිසම තරංග අංකිත සංඥා බවට පත්කිරීම
4. ප්‍රතිසම තරංග අංකිත සංඥා බවට පත් කිරීමත් අංකිත සංඥා ප්‍රතිසම තරංග බවට පත් කිරීමත්ය.

(9). ප්‍රවේශවීමේ වේගය වැඩිම හා ධාරිතාවය අඩුම තාවකාලික මතකයකි,


1. මතක රෙජිස්තරය (REGISTER) 2. වාරක මතකය (CACHE)
3. සසම්භාවී ප්‍රවේශ මතකය (RAM) 4. පඨන මාත්‍ර මතකය ( ROM)

(10). $35_{10}$ යන සංඛ්‍යාවට තුල්‍ය නොවන සංඛ්‍යාව වන්නේ,


1. $100011_2$ 2. $23_8$ 3. $23_{16}$ 4. $43_8$

(11). කහ පාටට අදාළ R -225 G -255 B - 0 නම් එහි ෂඩ්දශමය කේතය වන්නේ,

1. 00FF00 2. FFFFFFF 3. FFFF00 4. 000000


(12). 

ද්වාරයට තුලනය නොවන ද්වාරයකි,




1 2 3 4

(13). $AB + \bar{C}$ සඳහා තුල්‍ය වන රූපසටහන වන්නේ,




1 2 3 4

(14). පරිගණකය පණගැන්වීමට අදාළ නොවන වැඩසටහනකි,

1. POST  2. BIOS  3. BOOT STRAP LOADER  4. CMOS

(15). වර්තමාන WINDOWS මෙහෙයුම් පද්ධතිවල ගොනු කළමනාකරණ පද්ධතිය වන්නේ,

1. NTFS  2. FAT32  3. FAT 16  4. FAT

(16). මෙම නිරූපක සලකන්න.


A


B


C


D

අවලංගු කරන ලද ක්‍රියාවක් නැවත ලබා ගැනීමට උපකාර වන නිරූපකය වන්නේ,

1. A  2. B  3. C  4. D

(17). වදන් සැකසීමේ මෘදුකාංගයකින් සකස් කරන ලද ලේඛනයක සෝදුපත් ගැලපීම භාවිතා කල හැකි ක්‍රමවේදයක් වන්නේ,

1. වචන සෙවීම හා වෙනත් වචන ඒ වෙනුවට ප්‍රතිස්ථාපනය කිරීම
2. තීරු වෙන් කිරීම
3. නව ලේඛනයක් ලබා ගැනීම
4. තැපැල් මුසුව භාවිතය

මෙම සටහන අනුව 18, 19, 20 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

| | A | B | C | D | E |
|---|---|---|---|---|---|
| 1 | 7 | 3 | 4 | 2 | |
| 2 | 3 | 1 | 9 | 4 | |
| 3 | 6 | | 4 | 8 | |
| 4 | | | | | |

(18). = **sum(A1,C3,D2)** පිළිතුර වන්නේ,

1. 10  2. 12  3. 14  4. 15

(19). = **max( B1:D3)** පිළිතුර වන්නේ,

1. 9  2 . 4  3. 8  4. 7

(20). **A3:D3** දක්වා පරාසයේ අගය අඩංගු කෝෂ ගණන සෙවීමට අදාල ශ්‍රිතය වන්නේ

1. if  2. sum  3. count  4. Avg

(21). e - සමර්පණයක් සම්බන්ධව පහත කරුණු සලකා බලන්න.

A. කදාවෙන් කදාවට ගමන් කිරීමට ක්‍රියාකාරී බොත්තම් යෙදිය හැක.
B. e සමර්පණයක් අත් පත්‍රිකාවක් ආකාරයට මුද්‍රණය කල හැක.
C. e සමර්පණයක ශීර්ෂකය( header) පාදකය(footer) යෙදිය නොහැක.

සත්‍ය වන්නේ,

1. A හා B පමණි  2. A හා C පමණි  3. B හා C පමණි  4. A,B,C සියල්ලම

පහත දත්ත පාදකයට අදාළව අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| Stu_No | Name |
|---|---|
| 001 | Amila |
| 002 | Hiruni |
| 003 | Pamila |
| 004 | Sanduni |

Student Table

| Sport_ID | Name |
|---|---|
| S11 | Cricket |
| S12 | Tennis |
| S13 | Volleyball |
| S14 | Carom |

Sport Table

| Stu_No | Sport_ID | Year |
|---|---|---|
| 001 | S11 | 2017 |
| 004 | S12 | 2018 |
| 003 | S11 | 2017 |
| 004 | S14 | 2018 |

Student_Sport Table

(22). මෙහි ආගන්තුක යතුරක් වන්නේ,

1. student වගුවෙහි Stu_No ක්ෂේත්‍රය
2. sport වගුවෙහි Sport_ID ක්ෂේත්‍රය
3. Student_Sport වගුවෙහි Sport_ID ක්ෂේත්‍රය
4. Student_Sport වගුවෙහි Stu_No + Sport_ID ක්ෂේත්‍රය

(23). Student_Sport වගුවෙහි ප්‍රාථමික යතුර විය හැක්කේ,

1. Stu_No + Sport_ID 2. Stu_No 3. Sport_ID 4. Year


(24). මෙහි Student Table හා Sport Table වගු අතර ගණනීයතාවය කුමක්ද?

1. ඒක - ඒක 2. ඒක-බහු 3. බහු- බහු 4. 4 : 3

(25). ක්‍රමලේඛ ලිවීමේදී භාවිතා වන භාෂා පරිවර්තකයක් නොවන්නේ,

1. සම්පාදකය 2. අර්ථවින්‍යාසකය 3. ඇසෙම්බලර් 4.පටිපාටිය

පහත ගැලීම් සටහන අනුව පිළිතුරු සපයන්න.




(26). මෙහි **N** සඳහා **19** ඇතුළත් කළේ නම් ලැබෙන වර්ණය වන්නේ,

1. red 2. blue 3. green 4. Yellow

**(27).** මෙම ගැලීම් සටහනේ ඇති පාලන ව්‍යුහය වන්නේ,

1. අනුක්‍රමය පමණි
2. පුනර්කරණය පමණි
3. පුනර්කරණය හා සරල තේරීම
4. අනුක්‍රමය හා සරල තේරීම

**(28).** X=15

```
X=15
REPEAT
   DISPLAY X
   X=X-3
UNTIL X< 5
```

මෙම ව්‍යාජකේතයෙන් ලැබෙන ප්‍රතිදානය වන්නේ,

1. 15,12,9,6
2. 15,12,9,6,3
3. 3,6,9,12
4. 6,9,12,15

(29). **(N+2) div 2^3** මෙහි **N** සඳහා **10** ඇතුලත් කළවිට ලැබෙන පිළිතුර වන්නේ,

1. 8
2. 1
3. 1.25
4. 18

days :

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3 | 5 | 7 | | 9 | | 6 | 8 |

මෙම දින අරාව සම්බන්ධකොට ගෙන **30,31** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(30). මෙහි ඇති 7 යන අවයවයට අදාල සුචිය කුමක්ද?

1. 1
2. 2
3. 3
4. 4

(31). days [1] +days [2]+ days [4] හි අගය කුමක්ද?

1. 17
2. 15
3. 14
4. 21

(32). හානි නොවන පින්තූර ප්‍රවර්ගයක් වන්නේ,

1. JPEG
2. BMP
3. GIF
4. TIFF

(33). google docs හරහා යම් ලේඛනයක් සැකසීම හා සුරැකීම සම්බන්ධව අවාසියක් සඳහන් ප්‍රකාශනය වන්නේ,

1. යෙදුම් මෘදුකාංග ස්ථාපනය නොකර ලබාගත හැකි සේවයකි.
2. මෘදුකාංග සඳහා යන වියදම් අඩු කර ගත හැකි ක්‍රමයකි.
3. නඩත්තු ගැටලු අවමවීමය.
4. අඩුවේග සම්බන්ධතා වලදී ක්‍රියාකාරිත්වය අඩුය.

(34). පහත ඒවායින් සයිබර් අපරාධ වර්ගයට අයත් නොවන්නේ,

1. අනවසරයෙන් පුද්ගලයින්ගේ ඡායාරූප අන්තර්ජාලයට මුදා හැරීම
2. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර පුද්ගලයින් රැවටීම
3. පුද්ගලික ගිණුම් වෙත පිවිස පුද්ගලික තොරතුරු සොරා ගැනීම
4. අන්‍යයන් නිර්මාණය කර ඇති නිර්මාණ අනවසරයෙන් භාවිතා කිරීම

(35). HTML භාෂාවේ අර්ථදැක්වීම් ලැයිස්තුවක් ඉදිරිපත් කිරීමට භාවිතා වන උසුලනය,

1. dl
2. tr
3. td
4. dt

(36).

■ ***<u>SRI LANKA</u>*** ලෙස හැඩසවි කිරීමට අදාල උසුලන පමණක් අඩංගු වන පිළිතුර වන්නේ,

1. ul, u, b, li    2. ul,u,i,h1    3. ul,li, u,i    4. b,i,u,ol

(37). වෙබ් අඩවියකට මාධ්‍ය සම්පත් තෝරා ගැනීමේදී සැළකිලිමත් නොවිය යුතු කරුණක් වන්නේ,

1. හැකි පමණ සම්බන්ධතා (links) ඇතුළත් කිරීම අවම කිරීම
2. අනවශ්‍ය ශබ්ද ඉවත් කිරීම
3. ග්‍රාපික සංකෝචනය කර දැක්වීම
4. හිමිකම් නීතියට අනුව මාධ්‍ය තෝරා ගැනීම

(38). ප්‍රබල මුරපදයක් සඳහා උදාහරණයකි,

1. abc123    2. Aa_@47cc    3. mawanella    4. 45Axyz

(39). පද්ධති පරීක්ෂාවට අදාළ නොවන්නේ,

1. කේතය පරීක්ෂා කිරීම
2. ක්‍රමලේඛ පිළිබඳ දැනුවත් අයෙක් පද්ධතිය පරීක්ෂා කිරීම
3. දත්ත පාදක ගොනු පිළිබඳව දැනුවත් අයෙක් පද්ධතිය පරීක්ෂා කිරීම
4. ආදාන ලබාදී තමාට අවශ්‍ය ප්‍රතිදානය පමණක් ලබා ගැනීම

(40). IP ලිපිනයක් සඳහා සුදුසු නොවන්නේ පහත ලිපින වලින් කුමක් ද?

1. 64.0.0.0    2. 7.7.7.7
3. 156.255.255.255    4. 32.8.8.256

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| තෙවන වාර පරීක්ෂණය 2022<br>மூன்றாம் தவணைப் பரீட்சை 2022<br>Third Term Test 2022 | 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II<br>தகவல் மற்றும் தொடர்பாடல் தொழில்நுட்பம் II<br>Information and Communication Technology - II | පැය 2 යි<br>2 மணித்தியாலயம்<br>2 Hours |


පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(1).1.1.මනුකියවන්නෙකු නිවසකට පැමිණ ඔහුගේ දුරකථනය භාවිතයෙන් නිවෙස් අංකය හා විදුලි මීටරයෙහි පාඨාංකය බිල් සැකසීමේ පද්ධතියට ඇතුළත් කර එම මාසය සඳහා බිල කෙටි පණිවිඩයක් මඟින් නිවෙස් හිමියාගේ දුරකථනයට ලබාදේ. මෙහි ආදාන 2ක්, සැකසීමක්, ප්‍රතිදානයක් ලියා දක්වන්න.


1.2.පරිගණකයේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීම සඳහා උපයෝගිතා මෘදුකාංග යොදා ගැනේ. උපයෝගිතා මෘදුකාංග 2 ක් සඳහන් කරන්න.

1.3.චිත්‍රක පරිශීලක අතුරුමුහුණතක ප්‍රධාන කොටස් හතර **WIMP** මඟින් දැක්වේ.ඒවා මොනවාදැයි හඳුන්වන්න.

1.4.නියමු නොවන මාධ්‍ය පහත ආකාරයට වර්ගීකරණය කෙරේ. A හා B නම් කර භාවිතයක් ලියන්න.





1.5. මෙම රූපසටහනේ A B C D හඳුනාගන්න. ඒවායේ එක් කාර්යයක් බැගින් ලියන්න.



1.6. 11000111$_2$ යන්න අෂ්ටමය හා ෂඩ් දශමය කරන්න.

1.7. F සඳහා බූලීය ප්‍රකාශනය ලබා ගෙන සත්‍යතා වගුව ගොඩනගන්න.




1.8.
```
Count  :=1;
      begin
            for  i:= 1 to 5 do
                  Count  := Count + 2;
                  Writeln (Count);
      end.
```
මෙම pascal කේතයට අනුව ප්‍රතිදානය ලියන්න.

1.9. පහත 1 හා 2 තීරුවල ඇති වගන්ති අනුව 1 තීරුවේ ලේබලය හා 2 තීරුවේ ලේබලය ගලපන්න.

| 1 | 2 |
| --- | --- |
| A. ශ්‍රව්‍ය සන්ධාර මාධ්‍යයකි | P. Wave |
| B. ශ්‍රව්‍ය ගොනු ආකෘතියකි | Q. MotionBox |
| C. ශ්‍රව්‍ය සන්ධාර සංස්කරණ මෘදුකාංගයකි | R. Time Line Stage |
| D. නිර්මාණයට යොදා ගන්නා වීඩියෝ දර්ශන පෙලගස්වනු ලබන කොටස | S. MP3 DirectOut |

1.10. පරිගණක දෘෂ්ටි සහලක්ෂණය නිසා ඇතිවිය හැකි සංකූලතාවයක් ලියන්න.
එය මගහරවා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් ලියන්න.

(2). 2.1. a. ගොනුවලට ප්‍රවේශවන ක්‍රමයක් පහත රූපසටහනේ දැක්වේ. එය නම් කරන්න.





b. ගොනුවක් තැන්පත් කිරීමේදී එයට අදාල දත්ත ගණනාවක් පවත්වාගෙන යයි.ගොනුවලට අදාල දත්ත දෙකක් ලියන්න.

c. ගොනු හා ගොනු බහාලුම් වලට අදාල මෙහෙයුම් 2 ක් ලියන්න.

d. මෙහෙයුම් පද්ධතියේ ප්‍රධාන කාර්යයභාරය ලියන්න.

e. පහත ගොනුවලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. දී ඇති ගොනු පහත ගොනු බහාලුමේ එම වර්ගයට අනුව ගබඩා කර ඇත.



පහත එක් එක් ගොනුවේ නම් හා එය ගබඩා කර ඇති ගොනු බහාලුමේ නම් ලියන්න.

Amaradewa.mp3 Report.docs Programl.pas Science.xlsx

2.2.යම් පද්ධති නිර්මාණ කණ්ඩායමක් විසින් යම් ආයතනයකට තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීමට භාර ගනියි. එම කණ්ඩායමේ සාමාජිකයන් A,B,C,D,E පස් දෙනෙකු සිටිති. පද්ධතියේ අතුරු මුහුණත් සකස් කිරීමට D භාරගන්නා ලදී. පද්ධතියේ අවශ්‍යතා සොයාගැනීම සඳහා මූලාකෘතියක් සකස්කර තොරතුරු එකතුකිරීමට B භාර ගනියි. යම් පරිගණක භාෂාවක් යොදා ගෙන කේතකරණය කිරීමට E භාරගනියි. ප්‍රතිදාන පිළිබඳ පරීක්ෂාකිරීමට හා කේතපරීක්ෂාව භාරගන්නා ලද්දේ A විසින්ය. ආයතනයට පද්ධතිය හඳුන්වාදීම සහ දිගටම එය පවත්වාගෙන යාමේ කටයුත්ත භාර ගන්නා ලද්දේ C විසින්ය.

එක් එක් පුද්ගලයා කරන ලද කාර්යය අයත් වන පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ පියවර සඳහන් කරන්න.

(3). භාණ්ඩ මිලදී ගැනීමේ හා විකිණීමට අදාල පැතුරුම්පතක් පහත දැක්වේ.

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | භාණ්ඩ ගැණුම් හා විකුණුම් විස්තරය | | | |
| 2 | භාණ්ඩ අංකය | එකක ගැණුම් මිල | එකක විකුණුම් මිල | ලාභය |
| 3 | B0001 | Rs. 375.00 | Rs. 412.50 | Rs. 37.50 |
| 4 | B0002 | Rs. 450.00 | Rs. 495.00 | Rs. 45.00 |
| 5 | B0003 | Rs. 85.00 | Rs. 93.50 | Rs. 8.50 |
| 6 | B0004 | Rs. 820.00 | Rs. 902.00 | Rs. 82.00 |
| 7 | B0005 | Rs. 150.00 | Rs. 165.00 | Rs. 15.00 |
| 8 | | | මුළු ලාභය | Rs. 188.00 |
| 9 | ගැණුම් මිලට වඩා විකුණුම් මිල වැඩි කිරීමේ ප්‍රතිශතය | | 10% | |
| 10 | | | | |

3.1. B0001 භාණ්ඩයේ විකුණුම් මිල සෙවීමට C3 කෝෂයට ඇතුළත් කල යුතු සූත්‍රය ලියන්න. (අනෙකුත් භාණ්ඩවල විකුණුම් මිල සෙවීමට මෙය භාවිතා කල යුතු බව සලකන්න.)

3.2. B0001 භාණ්ඩයේ විකිණීමෙන් ලද ලාභය සෙවීමට D3 කෝෂයට ඇතුළත් කල යුතු සූත්‍රය ලියන්න.

3.3. මුළු ලාභය සෙවීමට D8 කෝෂයට ඇතුළත් කල යුතු ශ්‍රිතය ලියන්න.

3.4. ගැණුම් මිලට වඩා විකුණුම් මිල වැඩි කිරීමේ ප්‍රතිශතය 15% දක්වා වැඩි කළේ නම් අගය වෙනස් වන කෝෂ ලිපින සියල්ල ලියන්න.

3.5.භාණ්ඩ එකක ගැණුම් මිල හා එකක විකුණුම් මිල ඉදිරිපත් කිරීමට සුදුසු ප්‍රස්තාර වර්ග දෙකක නම් ලියන්න.

(4). පහත දැක්වෙන්නේ උසස් අධ්‍යාපන ආයතනයක ශිෂ්‍යයන් ,පාඨමාලා තෝරා ගැනීමට අදාල වගු 3 කි. ඒ අනුව අසා ඇති ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.

| ශිෂ්‍ය වගුව | | |
|---|---|---|
| StNo | StName | DOB |
| S1 | Krishna | 20/10/2001 |
| S2 | Amara | 18/19/2002 |
| S3 | Pradeep | 5/4/2001 |
| S4 | Rukshila | 6/2/2021 |
| S5 | Asanka | 2/7/2002 |

පාඨමාලා වගුව

| Code | Name | Fees Rs |
|---|---|---|
| C001 | IT | 150000 |
| C002 | Account | 200000 |
| C003 | Tec | 275000 |
| C004 | English | 125000 |
| C005 | Agriculture | 200000 |
| C006 | Language | 150000 |

තේරීම් වගුව


| StNo | Code | period |
|---|---|---|
| S! | C001 | 1 year |
| S2 | C002 | 1.5 year |
| S3 | C001 | 1 year |
| S1 | C002 | 1.5 year |
| S2 | C006 | 2 year |

4.1. එක් එක් වගුවල ප්‍රාථමික යතුරු වගු නාමය සමඟ ලියන්න.
4.2. ආගන්තුක යතුර ඇත්තේ කුමන වගුවේද ? ඒවා වගු නාමය සමඟ ලියන්න.
4.3. Amara පාඨමාලා සඳහා ගෙවා ඇති මුළු මුදල කීය ද?
4.4. StNo , DOB , Fees , period යන ක්ෂේත්‍ර සඳහා සුදුසු දත්ත ප්‍රරූප ලියා දක්වන්න.
4.5. Rizana ශිෂ්‍යාව Language පාඨමාලාව සඳහා ඇතුළත් වන්නේ නම් යාවත්කාලීන කලයුතු වගු මොනවාද? ඒවා යාවත්කාලීන කර ලියන්න.

(5).5.1. 1 හා 2 තීරුවල ඇති වගන්ති අනුව 1 තීරුවේ ලේබලය හා 2 තීරුවේ ලේබලය ගලපන්න.

| 1 | 2 |
|---|---|
| E. අන්තර්ජාලය මෙහෙයවනු ලබයි | T. Php |
| F. වෙබ් අඩවි හා දත්ත පාදක ගොනු සම්බන්ධ කිරීමට යොදා ගනී | U. FileZilla |
| G. නිදහස් වෙබ් Authoring tool එකකි | V. නියමාවලි |
| H. වෙබ් අඩවි උඩුගත කිරීමට යොදා ගනී | W. CKeditor |

5.2.පහත වෙබ් පිටුව සකස් කිරීමට අදාළ කේතය මෙහි ලබා දී ඇත. එහි හිස්තැනට සුදුසු උසුලන හා උපලක්ෂණ අදාල අංකය සමඟ ලියා දක්වන්න.




# Types of processors

Generally the number of processors in a central processing unit is used to classify the CentralProcessing Unit. The following table shows examples of some Intel Central Processing Units with multiple processor units.

| No of CPUs | Type |
|---|---|
| 1 | Single Core |
| 2 | Dual Core |
| 4 | Quad Core |

```
<html>
         <1><Title> Processors </title></1>
          <body>
             <2><center>Types of processors </center></2>
             <3> Generally the number of processors in a central processing unit
                 is used to classify the
                 <4>CentralProcessing Unit.</4>
                 The following table shows examples of some Intel Central
                 Processing Units with multiple processor units.</3>
                <center>  <img src="processor.jpg" 8="200" 9="200"> </center>
                <center><10 5="1">
                 <tr>
                  <6>No of CPUs</6>
                  <6>Type</6>           </tr>

                 <tr>
                  <7>1</7>
                  <7>Single Core</7>                    </tr
                 <tr>
                  <7>2</7>
                  <7>Dual Core</7>                     </tr>
                 <tr>
                 <7>4</7>
                 <7>Quad Core</7>                      </tr>
             </10></center>
         </body>
</html>
```

ලැයිස්තුව

Table , h1, th , height , td, border, head , u, p , width

(6). 6.1.පහත වදන් සැකසුම් ලේඛනයෙහි හැඩගැන්වීම් වලට අදාල අංකය නිරූපකයේ ලේබලය සමඟ ලියන්න.

# Use of number systems ← 1

Humans use computers for their everyday activities to make the tasks easier, <u>more</u> ← 4 <u>accurate and efficient,</u> but computers are unable to understand the data and ← 2 instruction provided in human languages. The computer understands **data and** ← 5 **instructions** such as text, numbers, images and sound that are fed to the computer by humans, *as numbers* → 6

[Learn More](#) → 7

3





← 9

8 ↘

10 ↘

| Number system | Symbols | Base |
|---|---|---|
| Binary | 0,1 | 2 |
| Octal | 0,1,2,3,4,5,6,7 | 8 |
| Decimal | 0,1,2,3,4,5,6,7,8,9 | 10 |
| Hexadecimal | 0,1,2,3,4,5,6,7,8,9,A,B,C,D,E,F | 16 |




6.2. හිස්තැනට සුදුසු පදය ලැයිස්තුවෙන් තෝරා ලේබලය සමඟ ලියන්න.

A. සමර්පන මෘදුකාංගයකි ..................................................................

B. සමර්පන කදාවක ඇතුළත් කල යුතු වාක්‍ය පේළි ගණන ...............................වේ.


C. කදාවක ඇතුළත් කල යුතු අකුරුවල ප්‍රමාණය .....................වේ.

D. සමර්පනයේ ඇති සියළුම කදා කුඩාවට පෙන්වන්නේ............................. මගිනි.

E. එක් දෘශ්‍ය රාමුවක සිට තවත් දෘෂ්‍ය රාමුවකට මාරුවීමට ...............................යොදා ගනී.

- OPEN OFFICE , APPLE KEY NOTE , Slide Transitions (කදා සංක්‍රමණය), 32 pt, කදා සුබෙදුම(slide sorter) , 6-9 ,සජීවීකරණය (Animation)

(7).7.1. ශිෂ්‍ය සමිතියක වාර්ෂික රැස්වීමේදී එහි සභාපතිත්වයට ශිෂ්‍යයින් දෙදෙනෙක් තරඟවදින ලදී. ඔවුන් දෙදෙනාට රතු හා නිල් වශයෙන් නිරූපණය සඳහා පාට වෙන් කරන ලදී. ශිෂ්‍යයන් 500 ක ගෙන් කැමැත්ත විමසා සභාපති තෝරා පත්කර ගනී. ඒ සඳහා සුදුසු ගැලීම් සටහනක් පහත ලබාදේ. එහි හිස්තැනට සුදුසු පදය A,B,C,D,E ලේබලය සමඟ ලියන්න.



7.2. පහත ව්‍යාජකේතයට අදාල ගැලීම් සටහන අඳින්න.

```
Begin
        Input age
        If age<18 then
                Display  “Can’t vote”
        Else
                Display  “Can vote”
        Endif
End.
```

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Sabaragamuwa Provincial Department of Education**

තෙවන වාර පරීක්ෂණය - 2022/2023 | 11 ශ්‍රේණිය

**Third Term Test – 2022/2023** | **Grade 11**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - II

**Information and Communication Technology - II**

# Answers

I Paper - Each question carries one mark.

| Que. Nu. | Answer | Que. Nu. | Answer | Que. Nu. | Answer | Que. Nu. | Answer |
|---|---|---|---|---|---|---|---|
| (1) | 3 | (11) | ~~2~~/ 3 | (21) | 1 | (31) | 4 |
| (2) | 2 | (12) | 4 | (22) | 3 | (32) | 3 |
| (3) | 4 | (13) | 2 | (23) | 1 | (33) | 4 |
| (4) | 1 | (14) | 4 | (24) | 3 | (34) | 4 |
| (5) | 1 | (15) | 1 | (25) | 4 | (35) | 1 |
| (6) | 4 | (16) | 2 | (26) | 4 | (36) | 3 |
| (7) | 2 | (17) | 1 | (27) | 4 | (37) | 1 |
| (8) | 3 | (18) | 4 | (28) | 1 | (38) | 2 |
| (9) | 1 | (19) | 1 | (29) | ~~2~~ ALL | (39) | 4 |
| (10) | 2 | (20) | ~~4~~/ 3 | (30) | 2 | (40) | ~~3~~/ 4 |

question (11) R value changed to 255.

1.1. Inputs - House Number, reading of the electricity **0.5 Marks**

Process - මාසික බිල ගණනය කිරීම calculating bill of that month **0.5 Marks**

Output - text message **1 Marks**

1.2.

Antivirus.,File Management System,Disk Management tools.,Compression tools., Disk cleanup tool.,File Management System.,Disk Defragmenter.,Backup utility. **2 Marks**

1.3. Window, Icon, Menu, pointer **2 Marks**

1.4. Radio waves, Infrared rays **2 Marks**

1.5. Switch/ Hub, Server, Printer, Router

s/h- connecting computers in the network
ser-managing centralize sw
router-connecting net to intrnt

**2 Marks**

1.6. $307_8$ , $C7_{16}$ **2 Marks**

1.7. $\overline{AB}$ + C

| A | B | C | AB | $\overline{AB}$ | $\overline{AB}$ + C |
|---|---|---|---|---|---|
| 0 | 0 | 0 | 0 | 1 | 1 |
| 0 | 0 | 1 | 0 | 1 | 1 |
| 0 | 1 | 0 | 0 | 1 | 1 |
| 0 | 1 | 1 | 0 | 1 | 1 |
| 1 | 0 | 0 | 0 | 1 | 1 |
| 1 | 0 | 1 | 0 | 1 | 1 |
| 1 | 1 | 0 | 1 | 0 | 0 |
| 1 | 1 | 1 | 1 | 0 | 1 |

3
**2 Marks**

5

7 1.8. ~~3 ,5 ,8,7,11~~ **2 Marks** A-S

9 1.9. C – Q , B - P , D – R , A – S **2 Marks** B-P

11 1.10. Redness of eyes, watery eyes, double vision **2 Marks** C-Q D-R

Taking a break every 30 minutes.

2.

2.1.

A. sequential access **1 Marks**

B. Size of file, location where file is stored, date and time of file storage **1 Marks**

C. Cut, Paste, Rename, Delete **1 Marks**

D. Provide interface between user and hardware **1 Marks**

E. Amaradewa.mp3 - Multimedia **1 Marks**

Report .docs - Educational

Program1.pas - Programs

2.2

A - Solution testing and debugging **1 Marks**

B - Identification of needs **1 Marks**

C - System Setup and Maintenance **1 Marks**

D - Planning the solution **1 Marks**

E - Coding the solution **1 Marks**

3.

3.1. =B3*C$9 **2 Marks**

3.2. =C3-B3 **2 Marks**

3.3. =sum(D3:D7) **2 Marks**

3.4. C3:C7, D3:D8 **2 Marks**

3.5. Circle graphs, line graphs **2 Marks**

pie

4.

4.1. Student Table - StNo Course Table - Code Selection Table - StNo+ Code

**2 Marks**

4.2. Selection Table - StNo , Code **2 Marks**

4.3. Rs . 350000 **2 Marks**

4.4. StNo – Text , DOB - Date , Fees - currency , period – Number/Text **2 Marks**

4.5. Student Table , Selection Table **2 Marks**

| StNo | StName | DOB |
|---|---|---|
| S6 | Rizana | - |

| StNo | Code | | period |
|---|---|---|---|
| S6 | C006 | | 2 year |

5.

5.1.

| |
|---|
| E – V , F – T , G – W , H - U |

**4 Marks**

5.2.

1 . head 2. h1 3. p 4. u 5. border 6. th 7. td 8. Width/ height

9. Width/ height 10. table **6 Marks**

6.

6.1.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1-P | 2- D | 3- Q | 4 - J | 5 - H | 6 - I | 7 - M | 8 - N | 9- S | 10 - F |

**5 Marks**

6.2.

A. APPLE KEYNOTE , B. 6-9 C. 32 pt D. slide sorter E- Slide Transition

6.3. slide sorter 5 **Marks**

7.

7.1.

A – 500 B – Yes C – Vote =Vblue ? D - Vred=Vred+1

E - Vreject=Vreject+1 **5 Marks**

7.2. **5 Marks**

